(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 82.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

2011 අප්‍රේල් මස 05 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0432/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රටක උද්ධමනය ගණනය කිරීමට බලය ලත් ආයතන කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය කොපමණද;

(iii) එක් එක් වර්ෂයේදී උද්ධමනය නිසා සිදුවන අගය අඩුවීම ගණන් බැලීමෙන් 1995 වර්ෂයේ රු.1000.00 ක අද වන විට මුදලේ තථ්‍ය වටිනාකම (1995 උපයන ලද රු. 1000.00 ක අද දින ක්‍රය ශක්තිය) කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රටේ ආර්ථිකය වගකීමෙන් තොරව මෙහෙයවීම වෙනුවෙන් වගකිවයුතු පුද්ගලයින්ගේ නම් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉන්දියාව, පාකිස්ථානය, මාලදිවයින, භූතානය, නේපාලය, සිංගප්පූරුව සහ මැලේසියාව වැනි රටවල උද්ධමනය පසුගිය වර්ෂ 5 සඳහා කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0535/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, සියඹලාණ්ඩුව - පොතුවිල් - අක්කරෙයිපත්තු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0791/'10

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

(iv) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(v) ගුරු ඌනතාවයක් පවතින විෂයයන් කවරේද;

(vi) ගුරු ඌනතා පවතින ඉහත පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0834/'10

4.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලබා ගන්නා ලකුණු අනුව 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගනු ලබන මුල් පාසල් 50 තුළ 2009 සහ 2010 වර්ෂවල පැවති ශිෂ්‍යත්ව විභාගයන්ගෙන් සමත් සිසුන් සඳහා 2010 සහ 2011 වර්ෂයන්හිදී වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සියලු පාසල් තුළ හෝ ඇතැම් පාසල් තුළ 2009 වර්ෂයේ විභාගය සමත් වූ සිසුන් සඳහා 2010 වර්ෂයේදී 6 ශ්‍රේණියෙන් වෙන්කළ පුරප්පාඩු ප්‍රමාණයට වඩා, 2010 වර්ෂයේදී සමත්වූ සිසුන් සඳහා 2011 වර්ෂයේ වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව අඩුවී තිබේද;

(ii) එවැනි අඩුවීමක් තිබේ නම්, ඊට හේතු කවරේද;

(iii) 6 ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාවේ අඩුවීමක් තිබේ නම්, අවම වශයෙන් 2010 දී වෙන්කළ පුරප්පාඩු ප්‍රමාණය 2011 දී ද වෙන්කර දීමට පියවර ගන්නේද;

(iv) නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තහවුරු කිරීම සඳහා, ශිෂ්‍යත්ව විභාගය සමත්වන සිසුන් වෙනුවෙන් දිවයිනේ ජනප්‍රිය පාසල්වලින් වෙන් කරනු ලබන පුරප්පාඩු ප්‍රමාණය ඉදිරියේදී අඩු නොකර පවත්වා ගැනීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0904/'10

5.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ යුද, නාවික සහ ගුවන් හමුදා සඳහා අවි ආයුධ සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීමේදී සිදුවූ බව කියන අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු ශිරානි තිලකවර්ධන මහත්මිය සභාපතිත්වය දැරූ කොමිෂන් සභාවක් අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම කොමිසම පත්කරන ලද දිනය කවරේද;

(iii) එකී කොමිසමේ සාමාජිකත්වය දැරූ අය කවරුන්ද;

(iv) එම කොමිසමේ වාර්තාව අතිගරු ජනාධිපතිතුමා වෙත භාරදෙන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කොමිසමේ විෂයය පරාසය කුමක්ද;

(ii) එමගින් ආවරණය කරන ලද කාලසීමාව කවරේද;

(iii) එම කොමිසන් සභා වාර්තාව පරිදි අක්‍රමිකතා හඳුනාගත්තේ නම්, ඒවා කවරේද;

(iv) එම වාර්තාව සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම වාර්තාව මගින් අක්‍රමිකතා සඳහා වගකිවයුතු පුද්ගලයින් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවරුන්ද;

(iii) එම තැනැත්තන්ට එරෙහිව මේ වන විට ගෙන ඇති නීතිමය හෝ විනයානුකූල පියවර කවරේද;

(iv) එසේ පියවර නොගන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0927/'10

6.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැය;

(ii) එම සම්පූර්ණ පිරිවැයෙන් දේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iii) විදේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iv) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබෙන මාර්ග;

(v) සම්පූර්ණ පිරිවැයෙන් ණය වශයෙන් ලැබෙන ප්‍රමාණය;

(vi) ණය මුදල් ප්‍රදානය කරනු ලබන රටවල්, අදාළ පොලී ප්‍රමාණයන් සහ ණය පියවීමේ කාල සීමාවන්;

(vii) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාල සීමාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0968/'10

7.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය කවරේද;

(ii) මෙම යෝජනා ක්‍රමය යටතේ ජලය ලබාදෙන ප්‍රදේශ කවරේද;

(iii) මෙම යෝජනා ක්‍රමය යටතේ ජල විදුලි බලාගාරයක් ඉදිකරනු ලබන්නේද;

(iv) එසේ නම්, එහි විදුලි ජනන ධාරිතාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපහුව ආසනය තුළ ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වලට ඉහත යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0649/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටුනායක අධිවේගී මාර්ගය ඉදිකිරීමේ කටයුතු 2000 වර්ෂයේදී ආරම්භ කර පසුව අවලංගු කරනු ලැබුවේද;

(ii) එම ඉදිකිරීම් කටයුතු නතර කරනු ලැබූ දිනය කවරේද;

(iii) එම කටයුතු නතර කරන අවස්ථාව වන විට වැයවී තිබූ මුදල කොපමණද;

(iv) අධිවේගී මාර්ගය සාදා නිම කිරීම සඳහා මුල් අවස්ථාවේදී ඇස්තමේන්තු කරන ලද පිරිවැය කොපමණද;

(v) කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එය යළි ආරම්භ කළ දිනය සහ ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) යළි වැඩ ඇරඹීම සඳහා වැයවූ මුදල කොපමණද;

(iv) වත්මන් කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගෙවා ඇති දඩ මුදල්ද ඇතුළත්ව මෙම ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදලේ පොලී අනුපාතිකය කවරේද;

යන්නද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0792/'10

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කඹුරුපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතා පවතින ඉහත පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0918/'10

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේනානිගල ප්‍රදේශයේ පදිංචි කිරීමට තීරණය කර ඇති ආදිවාසී පවුල් සංඛ්‍යාව;

(ii) මේ වන විට පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව;

(iii) එම පවුල්වලට අයත් පුද්ගලයින් සංඛ්‍යාව;

(iv) එක් පවුලක් සඳහා ලබා දීමට නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය;

(v) මේ වනවිට ඔවුන්ට ලබා දී ඇති හෝ ලබා දීමට අදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය;

කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආදිවාසී පවුල් වෙනුවෙන් සේනානිගල ප්‍රදේශයෙන් ලබාදීමට නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය ඔවුන් වෙත ලබා නොදීමේ වැඩ පිළිවෙළක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0928/'10

11\.
ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට, මත්තල නව ගුවන් තොටුපල ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැයෙන් දේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(ii) විදේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iii) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබෙන මාර්ග;

(iv) සම්පූර්ණ පිරිවැයෙන් ණය වශයෙන් ලැබෙන ප්‍රමාණය;

(v) එම ණය මුදල් ප්‍රදානය කරනු ලබන රටවල්, අදාල පොලී ප්‍රමාණයන් සහ ණය පියවීමේ කාල සීමාවන්;

(vi) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාල සීමාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0969/'10

12\.
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය යටතේ ජලය ලබා දෙන ප්‍රදේශ කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මෙම යෝජනා ක්‍රමය යටතේ දඹුල්ල හරහා මී ඔය ඔස්සේ යාපහුව හා ගල්ගමුව ප්‍රදේශවලට ජලය ගෙන ඒමට සැළසුම් කර තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) යාපහුව හා ගල්ගමුව ප්‍රදේශවලට ජලය ලබා දීමට වෙනත් ක්‍රමවේදයක් ඉදිරිපත් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1007/'10

13\.
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසල් පද්ධතිය තුළ සිටින වැඩ බලන විදුහල්පතිවරුගේ සංඛ්‍යාව කොපමණද;

(ii) වැඩ බලන විදුහල්පතිවරු සිටින පාසල්වල විදුහල්පතීන් ලෙස සේවය කිරීම සඳහා සුදුසුකම් ඇති, අධ්‍යාපන පරිපාලන සේවා විභාගය සමත්ව සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) ඊට අමතරව ඉහත පාසල්වල විදුහල්පති තනතුරු දැරීමට සුදුසුකම් ඇති, විදුහල්පති ශ්‍රේණීන් සමත්ව සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම විදුලහල්පතිවරු එම තනතුරු සඳහා පත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින තුළ ඇති ඉසුරු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) නවෝද්‍යා පාසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් සඳහා පසුගිය වර්ෂ පහ තුළ වෙන්කර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වයඹ පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වලට බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සේවකයින් බඳවාගත් පාසල් කවරේද;

(iii) එම සේවකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

*2.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

*3.

මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

සංගණන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6

සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— වී අලෙවි මණ්ඩලය පනත යටතේ යෝජනාව,— 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතේ 10 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (6) වැනි ඡේදය සමග කියවිය යුතු, 62 වැනි වගන්තිය යටතේ සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2010 දෙසැම්බර් 18 දිනැති අංක 1684/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.24 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

11.

මහේෂ්වරි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

12.

ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0222/'10

1.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාලසීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0672/’10

2.

ගරු අනුර දිසානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 10 තුළ, කෘෂි කාර්මික අවශ්‍යතාවයන් සඳහා,

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශ මඟින් ආනයනය කර ඇති පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත දෙපාර්ශ්වය විසින් ආනයනය කළ එක් එක් පොහොර වර්ගයේ ප්‍රමාණය, ආනයනය කළ රටවල් හා මිල ගණන් වාර්ෂික පදනම මත, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0673/’10

3.

ගරු අනුර දිසානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 10 තුළ, කෘෂිකාර්මික කටයුතු සඳහා,

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් නිෂ්පාදනය කළ මුළු පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත පරිදි නිපදවූ පොහොර ප්‍රමාණය, එක් එක් පොහොර වර්ගය හා නිෂ්පාදනය කළ අංශය අනුව වෙන් වෙන් වශයෙන්, වාර්ෂික පදනම මත කවරේද;

(iii) වාර්ෂිකව රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් නිපදවූ මුළු පොහොර ප්‍රමාණයේ වෙළෙඳපොළ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0675/'10

4.

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 10 තුළ,

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් වාර්ෂිකව ආනයනය කළ කෘෂිකර්මාන්තයට අදාළ බීජ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත පරිදි ආනයනය කළ එක් එක් බීජ වර්ගයේ ප්‍රමාණයන්, වටිනාකම්, ආනයන කළ රටවල් සහ මිල ගණන් රාජ්‍ය හා පෞද්ගලික අංශ අනුව හා වාර්ෂික පදනම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0676/'10

5.

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 10 තුළ,

(i) වාර්ෂිකව, රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් කෘෂිකර්මාන්තය සඳහා නිෂ්පාදනය කළ එක් එක් බීජ වර්ගයේ ප්‍රමාණයන් එම අංශ අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද ;

(ii) එම බීජවල වෙළෙඳපොළ වටිනාකම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0858/'10

6.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බස්නාහිර, සබරගමුව, වයඹ, මධ්‍යම, ඌව, උතුරු මැද, නැගෙනහිර සහ උතුරු පළාත් සභාවන් තුළ මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් පාසල්හි සේවය කරන ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවීමට තිබේද යන්න එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ හිඟ වැටුප් ගෙවීමට තිබේ නම්, 2010.01.01 දින වනවිට ඒ ඒ පළාත් මට්ටමින් ගුරුවරුන්ට ගෙවිය යුතු හිඟ වැටුප් ප්‍රමාණයන්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම හිඟ වැටුප් ගෙවීමට රජය මගින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ වෙන්කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හිඟ වැටුප් නොගෙවීමෙන් එම ගුරුවරුන්ට අසාධාරණයක් වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0909/'10

7.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සම්මන්තුරේ අංක 3, එම්. පී. සී. එස්. පටුමගේ, අංක 343/2 දරන ස්ථානයේ පදිංචි, ඒ. එම්. ඉස්මයිල් මහතා (උ.පො.කො. 20302) සම්මන්තුරේ පොලිස් ස්ථානයේ සිට පොතුවිල් පොලිස් ස්ථානයට අනුයුක්තකොට සේවයේ යෙදී සිටියදී සර්පයකු දෂ්ඨ කිරීමෙන් සේවයට වාර්තා කිරීමට නොහැකිවීම දැනුම්දීම ප්‍රමාදවීම හේතුකොටගෙන ඔහුගේ සේවය අත්හිටුවන ලද බවත්;

(ii) ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙසට ඉදිරිපත් කරන ලද අභියාචනා පිළිබඳව පරීක්ෂණ මේවන විට නිමවී ඇති අතර අම්පාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි විසින් අංක එස්/2/1/380/09 හා 2009/06/05 දිනැති ලිපිය මඟින් නැගෙනහිර දිසාව (දකුණ) නියෝජ්‍ය පොලිස්පතිවරයාට ඉස්මයිල් මහතා නැවත සේවයේ පිහිටුවීමේ ලිඛිත නිර්දේශයක් ලබා දී ඇතත්, මෙතෙක් ඔහු නැවත සේවයේ පිහිටුවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, සේවය අත්හිටවූ කාලයේ අපරාධ හෝ ත්‍රස්ත ක්‍රියාවල නොයෙදී, යහපත් හා චරිතවත් පැවැත්මෙන් සිටි ඉස්මයිල් මහතා 1998 වර්ෂයේ සිට ක්‍රියාත්මකවන පරිදි නැවත සේවයේ පිහිටුවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?